# මෝඩයාට මෙලොව හා පරලොව ලැබෙන දුක් සහ පණ්ඩිතයාට මෙලොව හා පරලොව ලැබෙන සැප

## බාලපණ්ඩිත සූත්‍රය හා දේවදූත සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා - මජ්ක්ධිම නිකාය 3 - පිටු අංක 360 - 397)

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වසන කල්හි භික්ෂූන් උදෙසා මෙය වදාළ සේක.

අනුවණ මෝඩයාට අත්වන දුක

“මහණෙනි, මෝඩයාගේ (බාලයාගේ) ඒ මෝඩ බව පෙන්වන ලකුණු, නිමිති, චරියා, හැසිරීම් තුනක් ඇත. එනම්,

1. නපුරු දේ සිතයි.
2. නපුරු දේ කියයි.
3. නපුරු දේ කරයි.

එසේ මෝඩයා නපුරු ලෙස සිතන්නේ, කියන්නේ, කරන්නේ නැත්නම්, නුවණැත්තන් විසින් මේ දුෂ්ට මෝඩයෙක් යැයි හඳුනා ගනු ලබන්නේ කෙසේ ද?

එසේ මෝඩයා නපුරු දේ සිතන, කියන, කරන නිසා ඔහු මෝඩ අසත්පුරුෂයෙකු යැයි නුවණැත්තෝ හඳුනා ගනිති.

මෝඩයා මේ ජීවිතයේ දී ම තුන් අයුරකින් දුක් විඳියි.

1. මේ මෝඩයා සභාවක, වීදියක හෝ ජනයා අතර ඉන්නා විට, ඔවුන් නුසුදුසු වැරදි දේවල් ගැන කතා කරන විට, ඒ දුසිරිත් (සතුන් මැරීම, හොරකම් කිරීම, කාමය වරදවා හැසිරීම, බොරු කීම, මත් පැන් පානය කිරීම) තමා තුළත් ඇතැයි දැන දුක් දොම්නස් විඳියි.

2. රටෙහි පාලකයෝ, නීතිය බිඳ වැරදි කරන අය අල්ලා දඬුවම් දෙති. එසේ දඬුවම් දිය හැකි වැරදි තමා තුළත් ඇති බව දැන, තමාටත් මෙසේ දඬුවම් විඳීමට සිදු විය හැකි බව දැන, ඔහු හැම විට ම දුක් දොම්නසින් ජීවත් වෙයි.

3. මෝඩයා පුටුවක ඉඳගෙන හෝ ඇඳක හෝ බිම නිදා ගෙන ඉන්නා විට නපුරු ලෙස සිතන ලද, කියන ලද, කරන ලද ලාමක අකුසල කර්ම ඔහුට හැම විට ම සිහි වෙයි. එවිට ඔහු තමා විසින් කරන ලද අකුසල් නිසා මරණින් පසු දුක් ඇති, සැප නැති නිරය ආදී ස්ථානවල ඉපදීමට සිදු වේ යැයි ශෝක කරයි. ක්ලාන්ත වෙයි. වැළපී හඬයි. පපුවේ අත් ගසමින් හඬයි. සිහි මුළා වෙයි. මෙසේ බාලයා මේ ජීවිතයේ දී ම දුක් දොම්නස් විඳියි.

බාලයා සිතින්, කයින්, වචනයෙන් දුසිරිත් කොට මරණින් පසු කටුක දුක් ඇති, නපුරු ගති ඇති නිරයට පැමිණෙයි. එහි දුක් ගැන උපමාවකින් වත් දැක්වීම පහසු නොවෙයි".

එසේ වදාළ කල්හි එක භික්ෂුවක් "ස්වාමීනි, උපමාවකින් දක්වන්නට හැකි ද?" යැයි ඇසීය.

"මහණ, රජතුමා විසින් යම් පාපකාරී සොරෙක් අල්ලා ගෙන මෙසේ දඬුවම් දෙයි.

ඔහුට උදය වරුවේ සිය වරක් කිණිසිවලින් ඇන තුවාල කරන්න යැයි පවසයි. දහවල රාජ පුරුෂයන් කැඳවා හොරාගේ තත්වය අසා ජීවත් වන බව දැන, දහවල ද සිය වරක් කිණිසිවලින් ඇන තුවාල කරන්නැයි පවසයි. මෙසේ ම සවස ද ජීවත් වන බව දැන කිණිසිවලින් සිය වරක් ඇන මරනු ලබයි. එසේ ඒ පුරුෂයා කිණිසි පහරවල් තුන් සියයක් ඇනීමෙන් කොපමණ දුක් විඳී ද?"

"භාග්‍යවතුන් වහන්ස, එක් කිණිසි පහරකින් වුවත් මහා දුකක් ලැබෙන විට, තුන් සියයක් ගැන කවර කතා ද?"

ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ ගල් කැටයක් ගෙන අත මිට මොළවා "මේ ගල් කැටය ද, හිමාල පර්වත රාජයා ද වඩා විශාල?" යැයි ඇසූ සේක.

“භාග්‍යවතුන් වහන්සේගේ අතේ තිබෙන ගල් කැටය ඉතා කුඩාය. හිමාල පර්වතය හා සැසඳීමට වත් නොහැකිය”.

“එසේ ම මහණෙනි, තුන් සියයක් කිණිසි පහරවලින් දඬුවම් ලැබූ හොරා යම් දුක් දොම්නසක් විඳී ද, ඒ දුක නිරයේ දුක සමඟ සැසඳීමට වත් නොහැකි තරම් ඉතා කුඩාය.

මහණෙනි, ඔහුට යම පල්ලෝ පස් ආකාර බන්ධනය නම් දඬුවම කරති. ගිනියම් වූ යකඩ උලක් වම් අතේ ද, තව එකක් දකුණු අතේ ද, තව එකක් වම් පයේ ද, තව එකක් දකුණු පයේ ද, තව එකක් පපුවේ ද, මෙසේ ගිනියම් වූ යකඩ උල් පහක් ගසති. එහි දරුණු කටුක දුක් වේදනා විඳින ඒ නිරි සත්වයා, ඒ පාප කර්මය ගෙවා අවසන් වන තුරු මරණයට පත් නොවෙයි.

මහණෙනි, යම පල්ලෝ ඔහු යකඩ පොළොවක දිගා කොට, පොරොවකින් සසිති (රහිනවා). ඒ පාප කර්මය ගෙවා අවසන් වන තුරු ඔහු මරණයට පත් නොවෙයි.

නැවත ද මහණෙනි, යම පල්ලෝ ඔහු ඔළුවෙන් හිටවා වෑයෙන් සසිති. එසේ ඒ පාප කර්මය ගෙවා අවසන් වන තුරු හේ මරණයට පත් නොවෙයි.

නැවත ද මහණෙනි, යම පල්ලෝ මොහු රථයක ගැට ගසා ගිනි ගෙන ඇවිලෙන්නා වූ ගිනි දැල් සහිත වූ පොළොවෙහි ඉදිරියට හා පසු පසට ගමන් කරවති. එසේ තියුණු වූ කටුක වූ දුක් විඳින ඔහු පාප කර්මය ගෙවෙන තුරු මරණයට පත් නොවෙයි.

මහණෙනි, යම පල්ලෝ ඔහු ඇවිලෙන, දැල්වෙන ගිනි දැල් සහිත වූ ගිනි අඟුරු පර්වතයකට නැංවීම ද බැස්වීම ද කරවති. එහි දී තියුණු වූ කටුක වූ දුක් වේදනා විඳියි. යම් තාක් ඔහුගේ පාප කර්මය ගෙවෙන තුරු මරණයට පත් නොවෙයි.

යම පල්ලෝ ඔහු ගෙන ගොස්, හිස යටට සිටින සේ ගිනියම් වූ, ගිනි ගන්නා, ගිනි දැල්වුණු ලෝහ හැළියේ (ලෝකුඹු නිරයේ) බහාලති. ඔහු එහි පෙණ දමමින් පැසෙයි. එහි පෙණ දමමින් වරක් උඩට යයි. වරක් යටට බසියි. වරක් හරහට යයි. හෙතෙම ඒ පාප කර්මය ගෙවෙන තුරු මරණයට පත් නොවෙයි.

ඉන් පසු යම පල්ලෝ ඔහු ගෙන මහා නිරයේ දමති. ඒ මහා නිරය නම්, කොන් සතරක් ඇති, දොරවල් සතරක් ඇති, කොටස් වශයෙන් බෙදන ලද යකඩ තාප්පයකින් සහ යකඩ පියනකින් වසා ඇති, එහි බිමත් යකඩින් ම සාදා ඇති ස්ථානයකි. ඒ මහා නිරයේ, බටහිර බිත්තියෙන් ගිනි දැල් විත් නැගෙනහිර බිත්තියේ වදියි. නැගෙනහිර බිත්තියෙන් ගිනි දැල් විත් බටහිර බිත්තියේ වදියි. උතුරු බිත්තියෙන් ගිනි දැල් විත් දකුණු බිත්තියේ ද, දකුණු බිත්තියෙන් ගිනි දැල් විත් උතුරු බිත්තියේ ද, යටින් ගිනි දැල් විත් උඩට ද, උඩින් ගිනි දැල් විත් යටට ද වදියි.

එහි පිළිස්සෙමින් තියුණු කටුක දුක් වේදනා විඳින නිරි සත්වයා, ඔහුගේ අකුසලය අවසන් වන තුරු මරණයට පත් නොවෙයි. දීර්ඝ කාලයකට පසු ව එහි නැගෙනහිර දොර විවෘත වෙයි. එවිට නිරි සත්වයා ඒ දොර දිශාවට වේගයෙන් දුවයි. එසේ දුවන ඔහුගේ සිවිය ද පිළිස්සෙයි. හම ද පිළිස්සෙයි. මස් ද පිළිස්සෙයි. නහර ද පිළිස්සෙයි. ඇටවලින් දුම් දමයි. මෙසේ පිළිස්සෙමින් බොහෝ වසර දහස් ගණනකින් එම දොර සමීපයට පැමිණෙයි. ඒ වන විට ඒ දොරටුව වැසී යයි. හේ තියුණු දුක් විඳියි. ඒ පාප කර්මය අවසන් වන තුරු මරණයට පත් නොවෙයි.

එසේ ම දීර්ඝ කාලයකට පසු එහි බටහිර දොර ඇරෙයි. උතුරු දොර ඇරෙයි. දකුණු දොර ඇරෙයි. එසේ ම ඒ නිරි සත්වයා බොහෝ දුක් විඳිමින් වසර දහස් ගණනක් දුව යන විට ඒ දොරවල් ද වැසෙයි. යම් කලෙක එක් දොරකින් ඔහු නික්ම යයි.

මහා නිරයට පසු ව ඒ අසලින් අසූචි නිරය වෙයි. එම නිරි සත්වයා එහි වැටෙයි. එහි ඉඳි කටු තුඩුවන් තුඩු ඇති පණුවෝ ඔහුගේ සිවිය කපා සම කපති. සම කපා මස් කපති. මස් කපා නහර කපති. නහර කපා ඇට කපති. ඇට කපා ඇට මිදුලු කති. තියුණු වූ කටුක වූ දුක් වේදනා විඳින ඒ නිරි සත්වයා, ඒ පාප කර්මය ගෙවෙන තුරු මරණයට පත් නොවෙයි.

එයට පසු ව විශාල උණු අළු නිරය පිහිටයි. එහි තියුණු වූ කටුක වූ දුක් වේදනා විඳින නිරි සත්වයා, ඒ පාප කර්මය ගෙවෙන තුරු මරණයට පත් නොවෙයි.

ඒ උණු අළු නිරයට පසු ව සියක් යොදුන් උස, අඟල් දහසයක් දිග කටු ඇති, ගිනි ගෙන දැවෙන, ගිනි ජාලාවකින් යුතු ඉඹුල් (පුළුන්) වනයක් වෙයි. යම පල්ලෝ ඔහු ඉඹුල් ගස්වලට නග්ගවති, බස්සවති. ඔහු ඒ

හේතුවෙන් දරුණු වූ කටුක වූ දුක් වේදනා විඳියි. ඒ පාප කර්මය ගෙවෙන තුරු මරණයට පත් නොවෙයි.

මහණෙනි, ඒ ඉඹුල් වනයට අනතුරු ව විශාල අසි පත්‍ර (කඩු තල වැනි කොළ ඇති) වනය වෙයි. එහි සුළඟින් වැටෙන අසි පත්‍ර නිසා අත ද කැපෙයි. කකුල ද කැපෙයි. අත්පා දෙක ම ද කැපෙයි. කන ද කැපෙයි. නාසය ද කැපෙයි. කන් හා නාසය යන දෙක ම ද කැපෙයි. එහි තියුණු වූ කටුක වූ දුක් වේදනා විඳින නිරි සත්වයා, ඒ පාප කර්මය ගෙවෙන තුරු මරණයට පත් නොවෙයි.

ඒ නිරයට අනතුරු ව මහත් වූ භෂ්ම (අළු) ගංගාව වෙයි. නිරි සත්වයා එහි වැටෙයි. ඉහළට ගසා ගෙන යයි. පහළට ගසාගෙන යයි. ඉහළට ද පහළට ද ගසා ගෙන යයි. එහි තියුණු වූ කටුක වූ දුක් වේදනා විඳියි. ඒ පාප කර්මය ගෙවා අවසන් වන තුරු මරණයට පත් නොවෙයි.

මහණෙනි, යම පල්ලෝ ඔහු බිලී කටුවෙන් අමුණා ගොඩට ගෙන පොළවේ දමා මෙසේ අසති.

"එම්බා පුරුෂය, නුඹ මොනවාටද කැමති?"

"ස්වාමීනි බඩගිනියි"

එවිට යම පල්ලෝ ගිනියම් වූ යකඩ අඬුවලින් ඔහුගේ මුඛය ඇර, ගිනි ගෙන දිලිසෙන යකඩ ගුලියක් දමති. ඒ ලෝහ ගුලිය ඔහුගේ තොල ද දවයි. කට ද දවයි. උගුර ද දවයි. බඩ ද දවයි. බඩවැල් සහ අතුණු බහන් ද දවාගෙන පසු පසින් වැටෙයි. ඔහු ඒ හේතුවෙන් දරුණු වූ තියුණු වූ කටුක වූ දුක් වේදනා විඳියි. ඒ පාප කර්මය ගෙවෙන තුරු මරණයට පත් නොවෙයි. නැවත යම පල්ලෝ ඔහුගෙන් මෙසේ අසති.

"නුඹ කැමති මොනවාටද?"

"පිපාසයි ස්වාමීනි"

යම පල්ලෝ ගිනි ගෙන දිලිසෙන යකඩ අඬුවලින් මුඛය විවෘත කර, ගිනි ගත් දිලිසෙන ලෝ දිය දමති. ඒ ලෝ දිය ඔහුගේ තොල ද දවයි. කට ද දවයි. උගුර ද දවයි. බඩ ද දවයි. බඩවැල් සහ අතුණුබහන් ද දවාගෙන

පසු පසින් නික්ම යයි. ඔහු ඒ හේතුවෙන් දරුණු වූ තියුණු වූ කටුක වූ දුක් වේදනා විඳියි. ඒ කර්මය ගෙවෙන තුරු මරණයට පත් නොවෙයි.

මහණෙනි, නැවත ද යම පල්ලෝ ඔහු මහා නිරයට ඇද දමති.

මහණෙනි, පෙර යම රජුට ද මෙසේ සිත් විය. ලෝකයේ යම් කෙනෙක් පව් කම් කරත් ද, ඔවුහු මෙබඳු විවිධ දුක් කම්කටොලු විඳිති. අරහත් වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ උපදනා කල්හි, මා මිනිසෙකු වී භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කෙරේ නම්, මට දහම් දෙසන සේක් නම් හා මා ඒ ධර්මය අවබෝධ කරන්නේ නම් ඉතා මැනවි.

මහණෙනි, මම මේ කරුණු අන් ශ්‍රමණයෙකුගෙන් හෝ බ්‍රාහ්මණයෙකුගෙන් අසා නොකියමි. මා විසින් ම දන්නා ලද, දක්නා ලද, ප්‍රත්‍යක්ෂ කරන ලද්ද ම කියමි. මහණෙනි, නිරයේ මෙතෙක් දුක ඇති යැයි සම්පූර්ණ වශයෙන් විස්තර කිරීමට පහසු නොවෙයි.

එසේ ම මහණෙනි, තණ කොළ කන තිරිසන් සත්තු සිටිති. තෙත් වූ ද වියළි වූ ද තණ කොළ දතින් කඩා කන අශ්වයන්, ගොනුන්, බූරුවන්, එළුවන්, මුවන් සහ අනෙකුත් තණ කොළ කන තිරිසන් සත්වයන් සිටිත් ද, බාලයා රස අනුභව කිරීම සඳහා මෙලොව පව් කම් කර මරණින් පසු ඔවුන් අතර උපදියි.

එසේ ම අසූචි අනුභව කරන තිරිසන් සත්තු සිටිති. ඒ සත්තු දුරින් ම අසූචි ගඳ ඉව කර ගෙන දුවති. එය කෙසේ ද යත් ‘මෙහිදී වළඳමු, මෙහිදී වළඳමු’ යැයි බමුණෝ යාග ගන්ධයෙන් දුවන්නා සේය. එසේ අසූචි කන්නා වූ කුකුළන්, බල්ලන්, ඌරන්, සිවලුන් සහ අනෙකුත් සත්වයෝ සිටිත් ද, ඒ බාල තෙම මෙලොව පංච කාමය විඳීම සඳහා පව් කම් කර මරණින් පසු ඒ සත්වයන් අතර උපදියි.

අඳුරේ උපදිනා, අඳුරේ ජීවත් වන, අඳුරේ වයසට යන, අඳුරේ මැරෙන කීටයන්, පණුවන්, ගැඩවිලුන් සහ වෙනත් තිරිසන් සත්තු සිටිත් ද, ඒ බාල තෙම මෙලොව පංච කාමය විඳීම සඳහා පව් කම් කර මරණින් පසු ඒ සතුන් අතර උපදියි.

දියෙහි උපදින, දියෙහි ජීවත් වන, දියෙහි මැරෙණ ප්‍රාණීහු (මාළුන්, කැස්බෑවන්, කිඹුල්ලුන් ආදී) සිටිති. බාලයා මෙලොව පංච කාමය විඳීම සඳහා පව් කම් කර මරණින් පසු ඒ සතුන් අතර උපදියි.

යම් යම් තිරිසන් ආත්මවල ඉපදෙන සත්තු සිටිති. ඒ සත්තු උපදින්නේ, ජීවත් වන්නේ, වයසට යන්නේ, මැරෙන්නේ,

- අසූචිවල,
- කුණු මස්වල,
- මළ කුණුවල,
- කුණු ආහාරයේ,
- කුණු කාණුවේ,
- කුණු වළෙහිය.

මෝඩයා (බාලයා) රස තණ්හාවෙන්, රස විඳීම වෙනුවෙන්, මෙලොව පව් කම් කර ඒ සතුන් අතර උපදියි. මහණෙනි, මේ තිරිසන් සතුන් විඳින දුක් මෙපමණ යැයි කීමට පහසු නොවෙයි.

මහණෙනි, යම් පුරුෂයෙක් එක සිදුරක් ඇති විය දණ්ඩක් (හරක් දෙදෙනෙකු එකට ගැට ගසන ලීය) මහ මුහුදට විසි කරයි. එය නැගෙනහිරින් බටහිරට ද, බටහිරින් නැගෙනහිරට ද, උතුරින් දකුණට ද, දකුණින් උතුරට ද සුළඟින් ගසා ගෙන යයි. වසර සියයකට වරක් දිය මතුපිටට එන, එක ඇසක් පෙනෙන කැස්බෑවෙක් සිටියි. ඒ කැස්බෑවා මේ එක් සිදුරක් ඇති විය දණ්ඩෙහි බෙල්ල ඇතුළු කරාවි ද?"

"ස්වාමීනි, ඉතාමත් දීර්ඝ කාලයක ඇවෑමෙන් මෙය සිදු විය හැකිය".

"මහණෙනි, ඒ කණ කැස්බෑවා, එක සිදුරක් ඇති විය දණ්ඩෙහි සිදුරෙහි බෙල්ල ඇතුළු කරන්නේ නම් එය වහා සිදු වන්නකි. එහෙත් වරක් නපුරු ගති ඇති දුගතියේ උපදින බාලයා, නැවත මනුෂ්‍යාත්වයට පැමිණීම ඊට වඩා අතිශයෙන් දුර්ලභ යැයි කියමි. ඒ කවර හෙයින් ද යත් මෙම අපායවල ධර්මයේ හැසිරීමක් වත්, සන්සුන් පැවැත්මක් වත්, කුසල ක්‍රියාවක් වත්, පුණ්‍ය ක්‍රියාවක් වත් නොමැත. ඔවුහු එකිනෙකා දුර්වලයන් මරා ගෙන කන්නාහුය.

මහණෙනි, දීර්ඝ කාලයකට පසු යම් හෙයකින් බාලයා මිනිසත් බවට පැමිණුනත්,

- සැඩොල්, වැදි ආදී නීච කුලයක උපදියි.
- ඉතාමත් දිළිඳු වී, කෑම බීම ඉතාමත් දුක සේ ලැබී, ඉතා අපහසුවෙන් ජීවත් වන්නේය.
- දුර්වර්ණ, අවලස්සන, මිටි, බොහෝ රෝගාබාධ ඇත්තෙක් වන්නේය.
- කණෙක් හෝ කොරෙක් හෝ කුදෙක් හෝ පිළෙක් වන්නේය.
- ආහාර පාන, වස්ත්‍ර, යානා, මල්, සුවඳ විලවුන්, හොඳ ගේ දොර පහසුවෙන් නොලබන්නෙක් වන්නේය.

හෙතෙම සිතෙන්, කයෙන්, වචනයෙන් නැවතත් දුසිරිත් (අකුසල්) කර මරණින් මතු සැප නැති, කටුක වූ තියුණු වූ දුක් ඇති අපායේ නැවත උපදියි".

නුවණැති පණ්ඩිතයාට ලැබෙන සැප

"මහණෙනි, සත්පුරුෂ නුවණැත්තාගේ (පණ්ඩිතයාගේ) පණ්ඩිත බව පෙන්වන ලකුණු, නිමිති, චරියා, හැසිරීම් තුනක් ඇත.

- සිතනුයේ යහපත් සිතුවිලි ම සිතයි.
- කියනුයේ යහපත් වචන ම කතා කරයි.
- කරනුයේ යහපත් දේ ම කරයි.

නුවණැත්තෝ, පණ්ඩිතයා විසින් යහපත් දේ සිතන, කියන, කරන බැවින් ඔහු පණ්ඩිතයෙක් ලෙස හඳුනා ගනිති.

පණ්ඩිත තෙමේ තුන් ආකාරයකින් මේ ජීවිතයේදී ම සුව සොම්නස් විඳියි.

1. ඔහු සභාවක හෝ මාර්ගයක හෝ සතර මං හන්දියක සිටිනා විට, එහි ජනයා යහපත් ක්‍රියා ගැන කතා කරනු අසයි. එසේ පණ්ඩිත තෙමේ තමා ද පස් පවින් වැළකුණු බැවින් ඒ අය කතා කරන යහපත් දේ තමා තුළත් ඇතැයි දැන සුව සොම්නස් විඳියි.
2. රටේ පාලකයෝ, නීති ඉක්මවා විවිධ අකුසල්, අකටයුතුකම් කරන්නන් අල්ලා ගෙන ඒ අයට දඬුවම් කරති. එසේ දඬුවම් විඳිය යුතු වැරදි ඔහු නොකරන බැවින් ඔහු බිය නොවෙයි. එම නිසා සුව සොම්නස් විඳියි.
3. පණ්ඩිතයා පුටුවේ හෝ ඇඳෙහි හෝ බිම ඉන්නා විට සිත, කය සහ වචනයෙන් කළ යහපත් දේවල් පිළිබඳ ඔහුට සිහි වෙයි. ඔහුට මෙසේ අදහස් වෙයි. 'මම අකුසල් නොකළෙමි. නරකක් නොකළෙමි. යහපතක් ම කළෙමි. කුසල් කළෙමි'. නපුරුකම් කරන අය උපදින යම් තැනක් ඇති ද, ඒ තැනට යන්නේ යැයි බියක් හෝ ශෝකයක් ඔහුට ඇති නොවෙයි.

ඔහු මේ තුන් සුව සොම්නස් විඳියි.

පණ්ඩිතයා මෙලොව දී ම මෙසේ තුන් වැදෑරුම් සුව සොම්නස් විඳියි.

පණ්ඩිත පුද්ගලයා සිතෙන්, වචනයෙන් හා කයෙන් යහපත් දේ කර, මරණින් පසු මනා සුව ඇති දෙව්ලොවට පැමිණෙයි. එහි ඇති සැප සම්පත් කොතරම් ද යැයි උපමාවකින් වත් පැවසීම පහසු නොවෙයි".

එවිට එක් භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේගෙන් "උපමාවක් කළ හැකිද?" යැයි ඇසුවේය.

"මහණ, සක්විති රජතුමා සප්ත රත්නයකින් හා සතර ඍද්ධියකින් බොහෝ සුව විඳියි.

1. චක්‍ර රත්නය

   ඔටුනු පළන් රජතුමා පසළොස්වක පෝය දිනයේ ස්නානය කර, පෙහෙවස් සමාදන් වී, උඩු මහලට නැඟ සිටිනා විට, දහසක් දැති ඇති, පට්ටම් ඇති, නැබ සහිත වූ සියලු අතින් පරිපූර්ණ වූ දිව්‍ය චක්‍ර රත්නය පහළ වෙයි. එවිට රජුට මෙසේ සිහිවෙයි. 'මා විසින්

මෙසේ අසන ලදි. යමෙකුට චක්‍ර රත්නය පහළ වේ නම්, ඔහු සක්විති රජ වේ' යැයි කියාය. එවිට තමා සක්විති රජ වේ දැයි ඔහුට සිතෙයි.

ඉන් පසු රජු නැගිට වමතින් කෙණ්ඩිය ගෙන,

"පින්වත් චක්‍ර රත්නය ගමන් කෙරේවා, පින්වත් චක්‍ර රත්නය දිනේවා"

යැයි චක්‍ර රත්නයට දකුණතින් පැන් වඩයි. එවිට ඒ චක්‍ර රත්නය නැගෙනහිරට යයි. රජු ද සිව්රඟ (අශ්ව, ඇත්, පාබල, රිය) සේනාව සමඟ ගමන් කරයි. යම් පෙදෙසක චක්‍ර රත්නය නවතියි ද රජු ද සේනාව සමඟ නවතියි. නැගෙනහිර දෙස යම් විරුද්ධ රජවරු වෙත් ද, ඔවුහු සියල්ලෝ ම සක්විති රජ වෙත පැමිණ,

"මහ රජතුමනි එනු මැනවි. ඔබගේ පැමිණීම යහපත්. ඔබ වහන්සේට අප අයත් වේවා. අපට අනුශාසනා කළ මැනවි" යැයි කියති.

සක්විති රජ මෙසේ අනුශාසනා කරයි.

"පන්සිල් රැකිය යුතුය. රජකම් කළ රාජ්‍යයේ ම රජකම් කරන්න".

එසේ නැගෙනහිර සියලු ම විරුද්ධ රජවරු ඔහුට යටත් වෙති. ඉන් පසු චක්‍ර රත්නය නැගෙනහිර මුහුදට බැස ඉන් එතෙර වී බටහිර මුහුදට බැස, එහි විරුද්ධ රජවරුන් ද දිනා, එලෙස ම දකුණු දෙසට හා උතුරු දෙසට ගොස් ඒවායේ විරුද්ධ රජවරුන් ද දිනා, පෙරළා තම රාජධානියට පැමිණෙයි. එහි පැමිණි චක්‍ර රත්නය රජුගේ අන්තඃපුරයේ දොරටුව ඉදිරිපිට සුන්දර ලෙස පිහිටයි.

2. හස්ති රත්නය

සක්විති රජුට සම්පූර්ණයෙන් සුදු පැහැති, සප්ත අංග පොළොවේ වදින, ඍද්ධි ඇති, අහසින් යන උපෝසථ කුලයේ ඇත් රජෙක් පහළ වෙයි. එවිට රජුට මේ ඇත් යානය හීලෑ කර ගතහොත් යහපත් යැයි සිත් වෙයි. එවිට ඒ ඇත් රජ හීලෑ වෙයි. මහණෙනි,

පෙර වූ දෙයක් කියමි. සක්විති රජතුමා ඇතුගේ හැකියාව විමසීමට සිතා දිනක් උදයේ ඇතු පිට නැඟ මුළු පොළොව වටා ගොස් තම රාජධානියට පැමිණ උදෑසන ආහාරය ගත්තේය.

3. අශ්ව රත්නය

සක්විති රජුට අශ්ව රත්නයක් පහළ වෙයි. ඒ අශ්ව රත්නය කළු පැහැ හිසක් ඇති, සියල්ල සුදු ශරීරයකින් යුක්ත, ඍද්ධි ඇති, අහසින් යන වළාහක කුලයේ අශ්වයෙකි. එවිට රජුට මේ අශ්ව යානය හීලෑ කර ගතහොත් යහපත් යැයි සිත් වෙයි. එවිට ඒ අශ්ව රත්නය හීලෑ වෙයි. මහණෙනි, පෙර වූ දෙයක් කියමි. සක්විති රජතුමා අසුගේ හැකියාව විමසීමට සිතා දිනක් උදයේ අසු පිට නැඟ මුළු පොළොව වටා ගොස් තම රාජධානියට පැමිණ උදෑසන ආහාරය ගත්තේය.

4. මාණික්‍ය රත්නය

ඉතා ලස්සන පැති අටකින් යුක්ත, හොඳින් ඔප වැටී ඇති වෛරෝඩි මාණික්‍යයක් වන එහි ආලෝකය යොදුනක් දුර පැතිර සිටියි. මහණෙනි, පෙර වූ දෙයක් කියමි. සක්විති රජ දිනක් එහි බලය විමසීමට සිතා සිවුරඟ සේනාව සමඟ කොඩියේ කෙළවර මැණික රඳවා රාත්‍රියේ ඝන අඳුරේ ගියේය. එවිට දෙපස ගම්වල වැසියෝ ඒ එළියෙන් දවල් වී යැයි සිතා වැඩ කරන්නට පටන් ගත්හ.

5. ස්ත්‍රී රත්නය

ඉතා විශිෂ්ට රූ ඇති, දැකුම්කලු, ප්‍රසාද එළවන ඇය ඉතා උසත් නොවූ ඉතා කොටත් නොවූ කෙට්ටුත් නොවූ මහතත් නොවූ ඉතා සුදුත් නොවූ කළුත් නොවෙයි. ඇයගේ පහස කපු පුළුන්වල පහස මෙනි. ඇයගේ කය උණුසුම් පරිසරයේ සිසිල් වෙයි. සිසිල් පරිසරයේ උණුසුම් වෙයි. සිරුරින් සඳුන් සුවඳ හමයි. මුවින් මානෙල් මල් සුවඳ හමයි. ඒ ස්ත්‍රී රත්නය රජුට පෙර නැගිටින්නේ, රජුට පසු නිදන්නේ වෙයි. රජුගේ සියලු කළ යුතු

දැ කරන්නී, ප්‍රිය වදන් කියන්නී, සිතිනුදු රජු නොඉක්මවන්නියක් වෙයි.

6. ගෘහපති රත්නය

රජුට ගෘහපති රත්නයක් පහළ වෙයි. ඔහුට අයිතිකරුවන් ඇති හෝ නැති ධන නිධාන දැකිය හැකි දිව්‍යමය ඇසක් ඇත. ඔහු සියලු ධනය රජුට සොයා දෙයි. මහණෙනි, පෙර වූ දෙයක් කියමි. සක්විති රජතුමා දිනක් ඔහු පරීක්ෂා කිරීමට සිතා ‘ගංගා’ නම් නදිය මැද නැවක දී මෙසේ කීවේය.

“මට අමු රන් අවශ්‍යයි”.

“එසේ නම් නැව ඉවුරකට ළං කරනු මැනව”.

යැයි ගෘහපතියා කියූව ද රජතුමා ගඟ මැද දී ම අමු රන් ඉල්ලුවේය. එවිට ගෘහපති රත්නය දෑතින් ජලය ස්පර්ශ කොට අමු රන් පිරවූ රන් කළයක් රජුට දී “මෙය ප්‍රමාණවත් ද?” යි ඇසුවේය.

7. පරිනායක රත්නය

සක්විති රජුට පරිනායක රත්නයක් පහළ වෙයි. පණ්ඩිත, මනා නුවණැති, රජුගේ සියලු කටයුතු බලා ගන්නා අනුශාසක වූ ඒ පරිනායක රත්නය “රජතුමනි, විවේක ව සිටිනු මැනව” යි පවසා සියලු කටයුතු මැනවින් ඉටු කරයි.

මේ සප්ත රත්නයයි.

සක්විති රජ සතර ඍද්ධියකින් සමන්විත වෙයි.

1. සක්විති රජ ඉතා දැකුම්කලු වූයේ සුන්දර වූයේ දර්ශනීය වෙයි. හේ අන් මිනිසුන්ට වඩා සුන්දර ද දර්ශනීය ද වෙයි.
2. සක්විති රජු අන් මිනිසුන්ට වඩා බොහෝ කල් ජීවත් වන දීර්ඝායුෂ ඇත්තෙක් වෙයි.

3. සක්විති රජතුමාට රෝග පීඩා රහිත වෙයි.
4. සක්විති රජුට බමුණන් ප්‍රිය මනාපය. එසේ ම බමුණන්ට ද සක්විති රජ ප්‍රිය මනාප වෙයි. පියාට පුතුන් හා පුතුන්ට පියා මෙනි.

මේ ආකාර සප්ත රත්නයකින් හා සතර ඍද්ධියකින් සක්විති රජ සමන්විත වෙයි.

මහණෙනි, මෙසේ සප්ත රත්නයකින් හා සතර ඍද්ධියකින් සමන්විත සක්විති රජ, සුව සොම්නස් විඳින්නේ දැයි සිතන්නේද?''

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, එක් රත්නයකින් පමණක් වුව ද මහා සැප සොම්නසක් විඳිය හැකි විට සප්ත රත්න හා සතර ඍද්ධි පිළිබඳ කෙසේ කියන්නද?''

එවිට භාග්‍යවතුන් වහන්සේ අතට ගලක් ගෙන මිට මොළවා මෙසේ ඇසූ සේක.

''මහණෙනි, මේ ගල ද හිමාල පර්වතය ද වඩා විශාල?''

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මෙය සැසඳීමට වත් නොහැකිය. ඒ තරම් හිමාල පර්වතය මේ කුඩා ගල් කැටයට වඩා විශාලය''.

''මහණෙනි, එපරිදි ම සක්විති රජ විඳින සැප සොම්නස් දිව්‍ය සුඛය සමඟ සැසඳීමට වත් නොහැකිය. එතරම් දෙව්ලොව සැප ඉතා අධික වෙයි. එසේ පණ්ඩිත තෙම දීර්ඝ කාලයක් දෙව්ලොව සැප විඳීමෙන් පසු ව මිනිස් ලොවට පැමිණෙන අවස්ථාවක් ඇති විය හැකිය. එහි දී ඔහු රජ බමුණු ආදී මහා පොහොසත් තැන්වල ඉපදී, බොහෝ වස්තු ඇති ව, විශිෂ්ට රූ ඇති ව සුවසේ ජීවත් වෙයි. ඔහු එහිදී ද කයින්, වචනයෙන්, සිතින් මනා වූ යහපත් වූ කුසල වූ කර්ම සිදු කර නැවත සුගතිගාමී වෙයි.

මෙය බාලයා හා පණ්ඩිතයා අතර වෙනස වෙයි''.